සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I,II

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 03යි විනාඩි 10 යි.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුයි.

**(i)** සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) මට වුණේ **ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා** වගේ වැඩක් යැයි කියමින් ගුණදාස පිටත් ව ගියේය.
(1) අවදානම් වැඩක් අනුන් ලවා කරවීම. (2) ආපදාවෙන් ගැලවෙන්නෙක් නැත.
(3) කිසිම ප්‍රයෝජනයක් නොලැබීම. (4) එක් විපතකින් ගැලවී තවත් විපතකට පත් වීම.

(02) සමාජය තුළ වැඩ කිරීමේ දී ගැටවලට **හසුවන** අවස්ථා ද ඇත.
(1) අනුන්ගේ උගුල්වලට හසු වීම. (2) දරුණු ලෙස පළිගැනීම.
(3) ඕනෑවට එපාවට වැඩ කිරීම. (4) අනතුරක සේයා පහළ වීම.

(03) සමන් විභාග ප්‍රතිඵල ලැබෙන තුරු **ඇඟිලි ගනිමින්** සිටියේ ය.
(1) පමණට වඩා සූදානම් වීම. (2) නොඉවසිල්ලෙන් සිටීම.
(3) මහත් බියට පත් වීම. (4) තද ආශාවෙන් යමක එල්බ ගෙන සිටීම.

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) පැරණි අධ්‍යාපන ක්‍රමය තුළ ................................ ප්‍රධාන කාර්යයකි.
(1) නිරීක්ෂණය (2) වනපොත් කිරීම. (3) පරිශීලනය (4) විමර්ශනය

(05) කඩිනම් ගල්ඔය ව්‍යාපාරය ආශ්‍රිතව ගොවි ජනපද ................................ කරන ලද්දේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා විසිනි.
(1) ප්‍රතිසංස්කරණය (2) ප්‍රතිස්ථාපනය (3) ප්‍රතිෂ්ඨාපනය (4) ප්‍රතිනිර්මාණය

(06) රචනා රීතිය යනු භාෂා භාවිතයේ දී විශිෂ්ට ලෙස කෙරෙන පද ................................ යි.
(1) සංකෝචනය (2) සංඝටනය (3) කෙටිකිරීම (4) ගැළපීම.

(07) අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) තබ්ලාව, බටනළාව, වීණාව, සර්පිනාව
(2) නාමපද, ක්‍රියාපද, නිපාත, උපසර්ග
(3) රියන, නියන, කියත, මිටිය.
(4) ළමයි, ගුරුවරු, දෙමව්පියෝ, ආදි ශිෂ්‍යයෝ

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) විශිෂ්ට, දෘෂ්ඨිය, නිශ්ඵල, කොට්ඨාසය.
(2) දෘඪතර, සඣ්ඨාරය, මජ්ඣිම, චන්දය.
(3) අලුයම, ගැටලු, සමස්ත, මහලු
(4) ශාඛය, අවස්ථෝචිත, ව්‍යංගාර්ථ, දූරකථනය.

(09) අරුණ, ජීවිතය, මැදඟිල්ල, ආධාර යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කෙටි පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.
(2) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය හා ඇලපිල්ල.
(3) කෙටි ඇදය, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.
(4) කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා කෙටි පාපිල්ල.

(10) ''රළ'' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

(1) කණ්ඨජ (2) තාලුජ (3) මූර්ධජ (4) දන්තජ

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමයෙක්, කාන්තාවක, අපි, කම්කරුවන්
(2) ළමයි, අලියෙක්, වෛද්‍යවරු, ඔවුන්
(3) මිනිසුන්, නීතීඥවරයකු, ගොවියෙක්, මම
(4) ළමයෙක්, කාන්තාවක්, ඔවුහු, ගුරුවරු.

(12) ''අති + අවශ්‍ය'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය (2) ආත්‍යාවශ්‍ය (3) ආත්‍යවශ්‍ය (4) අත්‍යාවශ්‍ය

(13) ''ආදිවාසීහු වන වදුලෙහි ජීවත්වීමට කැමැත්තක් දක්වති'' යන වාක්‍යයේ 'වන වදුලෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය (2) කර්ම විභක්තිය (3) ආධාර විභක්තිය (4) කරණ විභත්තිය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.**

(14) සාර්ථක කෙටි කතාවක් **ආකස්මික ව** කළ හැකි දෙයක් නොවේ.

(1) හේතුවක් ඇතිව (2) ක්ෂණිකව (3) එක දිගට (4) හේතුවක් නැතිව

(15) කලා නිර්මාණ කරුවා තම අත්දැකීම් **ප්‍රතිනිර්මාණය** කිරීමෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.

(1) යළි නිරීක්ෂණය (2) යළි ආපසු බැලීම (3) යළි ගොඩනැංවීම. (4) යළි උපකල්පනය

(16) '**ඤ**' යනු තාලුජ අක්ෂරයකි.

(1) මුදුනෙන් හටගන්නා
(2) තල්ලෙන් හටගන්නා
(2) තොල්වලින් හටගන්නා
(4) උගුරෙන් හට ගන්නා.

(17) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගය අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - සිරිමත්, ගුණවත්, කුල්මත්, දිරිමත්
(2) මිශ්‍ර ක්‍රියා - ගය ගයා ලියමින්, කියමින්, බලමින්
(3) සන්ධි - එදිනෙදා, දකුණත, වියවුල, අරුණෝදය
(4) සමාස - කිරිබත්, මව්පිය, වනමල්, දසබල

(18) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.

(1) පොත, පත්‍රය, සඟරා, ලිපිය
(2) වඩු බංකුව, දඬුඅඬුව, අතකොළුව, කියත.
(3) පතල, ඉල්ලම් කුර, කූඩය, උදැල්ල.
(4) පෑන, පැන්සල, පන්හිඳ, කංචුකය.

(19) එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) පොත - ග්‍රන්ථය, උවම් - උපමා, සබවස - අසත්‍යය, චිරන්තන - පෞරාණික.
(2) මුහුද - අර්ණවය, ද්‍රැමය - ශාකය, අත - හස්තය, දියත - ලෝකය.
(3) නයන - ඇස, හසළත්වය - නිපුණත්වය, උක්තීන් - කියමන්, තඹර - මානෙල්.
(4) සෙව්වන්දි - ඉද්ද, ඉසුරු - සම්පත්, වණ - අකුර, සමය - ආගම.

(20) මුලි දී ඇති පදයට **සමානාර්ථයක් නොයෙදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පණ්ඩිත - විද්වත්, බහුශ්‍රැත, ව්‍යක්ත, විශාරද.
(2) අනංගයා - වියොවග, මල්සරා, මින්දද, මලවි.
(3) දක්ෂ - විදග්ධ, නිපුණ, ස්නිග්ධ, ප්‍රවීණ.
(4) ජලය - අඹ, දල, උදක, සිලිල.

(21) **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ආකුල - ව්‍යාකුල (2) නුවණ - නුනුවණ (3) ඍජු - කුටිල (4) ප්‍රත්‍යක්ෂ - අනුමාන

(22) **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) දරුවා අඬමින් අම්මා ළඟට දිව්වේය.
(2) නීතිරීතිවලට අනුගතව කටයුතු කරනු මැනවි.
(3) ගෙවිලිය කවි කියමින් ගොයම් නෙළයි.
(4) ළමයා පොත් ටික අතට ගෙන පාසලට ඉක්මනින් ගියේ ය.

(23) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'තොමෝ' යන්නෙහි පුරුෂවාචී නාමපදය වන්නේ 'තෙමේ' යන්නයි.
(2) 'සිහිනිඟ යන්න ස්වරාදේශ සන්ධි පදයකි.
(3) 'අප' යන්න අනුක්ත නාමපදයකි.
(4) 'කිරිබත්' විභක්ති සමාස පදයකි.

- **අංක 24 සිට 26 තෙක් ප්‍රශ්නවල තද අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(24) ශ්‍රී ලංකාව **මනස්කාන්ත** දිවයිනකි.

(1) සිත් නළවන (2) සිත් සතුටු කරවන (3) සිත් ඇදගන්නා (4) සිත් ඔකඳ කරවන

(25) ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම සඳහා මහාචාර්ය සේනක බිබිලේ **අප්‍රතිහත** ධෛර්යයෙන් යුතුව කටයුතු කළේ ය.

(1) නොපසුබස්නා (2) ඉතා මහන්සියෙන් (3) සිත් රිදවන (4) අඛණ්ඩ

(26) පැරණි **සම්භාව්‍ය** කෘති රචනා කිරීමේ දී උපමා භාවිතයට ගෙන ඇත.

(1) පාලි (2) අලංකාර (3) පැරණි (4) උසස්

- **අංක 27, 28 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

(27) 'අය මාර්ග මුළුමනින් ම නැතිකර ගැනීම'

(1) අඬුව තිබෙද්දී අත පුළුස්සා ගැනීම.
(2) අතු කඩා මොර කන්නා සේ.
(3) ගෙන්දගම් පොළොව රත්වෙලා වගේ.
(4) ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ.

(28) 'නැති වූ දෙයෙහි අගය වැඩි යයි සිතීම'

(1) පරිස්සමට තිබූ දෙය ඇලියාවට ගියා වගෙයි.
(2) ගඟට ඉනි කැපුවා වගෙයි.
(3) ගිය ලූලා මහ එකා.
(4) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.

◆ **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(29) (1) සිසුහු පස්දෙනෙක් සිංහල විෂයට විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.
(2) පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.
(3) අපි එය කළොත් යෙහෙකි.
(4) දක්ෂ ක්‍රීඩකයෙක් වන්නේ කෙසේ ද?

(30) (1) ගංගාවෝ ගලා බසියි.
(2) ඈ ගුරුවරියක වූවා ය.
(3) අපි ශ්‍රී ලාංකික පුරවැසියන්
(4) ඒ තෙම මහන්සියෙන් වැඩ කළේ ය.

(31)
- මොහොතක නිහඬතාවට ........... සභාවෙන් ප්‍රතිචාරයක් ලැබිණි.
- සෙබළු වහා ම ක්‍රියාත්මක වූ.......... ප්‍රතිවාදීන්ගේ ප්‍රයත්නය අසාර්ථක විය.
- සැළලිහිණි කවියා සන්ධ්‍යා වර්ණනය ........... අපූර්ව කාව්‍ය සංකල්පනා මැවීමට සමත් වේ.
- හින්දු උත්සව අතරින් දීවාලි ......... දීපවාලිය වැදගත් හා වර්ණවත් උත්සවයකි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පසු, හෙවත්, බැවින්, තුළින්
(2) පසු, බැවින්, තුළින්, හෙවත්
(3) පසු, තුළින්, බැවින්, හෙවත්
(4) පසු, තුළින්, හෙවත්, බැවින්.

(32) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූවිට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒ ගොල්ලො අපේ වැඩේ කරනව.''

(1) ඔවුහු අපේ වැඩ කරති. (2) ඔවුන් අපේ වැඩ කරති. (3) ඔව්හු අපේ වැඩ කරහු. (4) ඔවුන් අපේ වැඩ කරහි.

(33) 'සෙංකොට්ටං' නමැති නව කතාවේ රචකයා වන්නේ,

(1) ඒ.වී. සුරවීර
(2) සිරි ගුණසිංහ
(3) මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
(4) මහගමසේකර

(34) ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1) කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට
(2) සිසිවන දුවන ඉඟ සුඟ ගත හැකි මිටින
(3) සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී.
(4) පුවළ සිහළ දළ බළ මුළුනිති ඔසළ

(35) ''ඇගෙ රන්වන් මුව කුඩා ය; ජපා පුෂ්පයක් බඳු ය.'' යන පාඨයෙහි 'ජපා පුෂ්පයක්' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) නිල් මහනෙල් (2) රෝස මලක් (3) වද මලක් (4) පිච්ච මලක්

(36) පහත සඳහන් කවියේ දෙවෙනි පදය සම්පූර්ණ කරන්න.

හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
.......................................................................................
පුල් නිලුපුල් සම් වන් කතක වුවනත
කලදෝ කැට තෙලෙක දිසි වැනි පැහැ දිමුත

(1) නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
(2) ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත
(3) පහන් බැවින් පිටතට සස ලෙසින් වත
(4) තර පතරින් සඳ'දර තර පහර දෙත

(37) ''පෙර දිග ගොරහැඬි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කළු රෙදි පොට
මොකටද මේ තීරුවලට ඉරා දමන්නේ''

ඉහත සඳහන් කවියේ රචකයා වන්නේ,

(1) සිරි ගුණසිංහ
(2) ගුණදාස අමරසේකර
(3) කුමාරතුංග මුනිදාස
(4) චන්ද්‍රරත්න මානවසිංහ

(38) ප්‍රාදේශීය ව්‍යවහාරයේ දී 'බක්කම්මා' යනු
(1) බාලම්මා (2) කුඩම්මා (3) පුංචි අම්මා (4) ලොකු අම්මා.

(39) ''කළුගැහී තරගයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මීසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක
අවටත් නැත
නිව්යෝර්ක් නම් පුරවර
සියක් මහල් එක් ටැම් ගෙය මුදුනේ
දොර ජනෙල් වඩා සිර කළ කාමරයක
ඇඳක් - පුටුවක් - මේසයක්
මම''
මෙම පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,

(1) කාමරයක් ගැන ය. (2) බෝඩිමක් ගැන ය. (3) කාර්යාලයක් ගැන ය. (4) නිවසක් ගැන ය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

''මිනිස් හිතේ හට ගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි''

(1) මිනිස් හිතේ පහළ වන හැඟීම් ප්‍රකාශ කරන මාධ්‍යය භාෂාවයි.
(2) මිනිස් සිත තුළ ජනිත වන අදහස් ප්‍රකාශ කරන උපකරණය භාෂාවයි.
(3) මිනිස් සිතෙහි පහළ වන සියලු ම දේ ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි.
(4) සිත තුළ ජනිත වන හැඟීම් ප්‍රකාශ කරනුයේ භාෂාව මගිනි. (ලකුණු 1 x 40 = 40)